# විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල - 2012

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 අනුව මූල්‍ය ප්‍රකාශන කට්ටලය සමඟ ඉදිරිපත් කළයුතු ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.

#### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) 2012 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ ශේෂය රු.20,832,082,627 ක් වූ අතර එහි ඇතුළත් වූ රු.6,851,305 ක් වූ හඳුනා නොගත් ශේෂය හඳුනාගෙන අදාළ ගිණුම්වලට ගැලපීම් කර නොතිබුණි.

(ආ) 2012 ජනවාරි 01 දිනට රු.8,000,000 ක්වූ අක්‍රීය සාමාජික වෙන් කිරීමේ ගිණුමේ ශේෂයෙන් වර්ෂය තුළදී විධිමත් අනුමැතියකින් තොරව රුපියල් මිලියන 05 ක මුදලක් සංචිත නමින් ආදායමට ගෙන තිබුණි.

(ඇ) හිඟ ජීවන වියදම් පියවීම සඳහා විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල වෙත ලැබුණු රුපියල් මිලියන 500 කින් රුපියල් මිලියන 270.4 ක මුදලකට අදාල හිඟ ජීවන වියදම් දීමනාව ගණනය කර විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සාමාජික ගිණුම් වෙත බැර කිරීමට කටයුතු නොකර ගෙවිය යුතු ගිණුම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

1.2.3 <u>ගෙවිය යුතු ගිණුම්</u>

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) රු.20,732,055 ක් වූ ගෙවියයුතු අර්ථසාධක අරමුදල් (Refunds Payable ) ශේෂය සකස් වී තිබුණේ සේවය අවසන් වී ඇති නමුත් සාමාජික අරමුදල් සඳහා හිමිකම් නොපෑ ශේෂයන්ගේ එකතුවෙනි. මෙම ශේෂයන් සඳහා ලියූ චෙක්පත් අවලංගු කර ඇති මුත් රු.19,437,750 ක් වර්ෂ 01 සිට 11 දක්වා කල් ඉකුත් වූ චෙක්පත් වටිනාකම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල පනතේ 93 වගන්තිය අනුව කටයුතු කර නොතිබුණු අතර ලැබෙන පොළිය රාජ්‍ය ආදායමට බැර කිරීම වෙනුවට සාමාජික ගිණුම්වලට බැර කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු. 41,600 ක ණයහිමි ශේෂයේ කාල විශ්ලේෂණය අවුරුදු 03 සිට අවුරුදු 09 දක්වා විහිදී තිබුණි.

1.2.4 <u>නිතී රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.</u>

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය කෙරේ.

| <u>නිතී,රීති, යනාදියට යොමුව</u> | <u>අනුකූල නොවීම</u> |
|---|---|
| (අ) 2011 මාර්තු 23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය | 2011 මාර්තු 23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය සංශෝධනය කිරීමට කටයුතු කිරීමකින් තොරව භාණ්ඩාගාර එකඟත්වය මත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අධ්‍යයන දීමනාව, මුළු ඉපයීම් යන නිර්වචනය තුළට ඇතුළත් කර 2013 ජනවාරි 08 දින අංක 1000 දරන චක්‍රලේඛය නිකුත් කර තිබුණි. යථෝක්ත චක්‍රලේඛය නිකුත් කිරීමට පෙර අධ්‍යයන දීමනාව ඇතුළත් කිරීම හේතුවෙන් අර්ථසාධක අරමුදලට වැඩිපුර ලැබුණු රුපියල් මිලියන 217.49 දායකය පියවීමට හෝ විධිමත් ක්‍රියාමාර්ගයක් ගැනීමට 2012 දෙසැම්බර් 31 දින දක්වා කටයුතු කර නොතිබුණි. |
| (ආ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 91 වගන්තිය | 2012 වර්ෂයේදී සේවක අර්ථසාධක අරමුදලේ පිළිවෙලින් රු.1,610,934,308 ක හා රු.1,625,642,752 ක ආදායම් හා වියදම් ගිණුම්ගත කර තිබුණද අරමුදල විධිමත් කිරීම, පරිපාලනය කිරීම සහ එහි |

| | |
|---|---|
| | කළමනාකාරත්වය සඳහා කොමිෂන් සභාව විසින් නියමාවලි සකස් කර නොතිබුණි. |
| (ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2001 පෙබරවාරි 02 දිනැති මූල්‍ය චක්‍රලේඛ අංක 3/2001 | කිසියම් මාසයකට අදාළ අර්ථසාධක දායක මුදල් ඊලඟ මාසයේ 10 වෙනිදාට පෙර හෝ එදින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම වෙත ලැබිය යුතු වුවද විශ්වවිද්‍යාල හා අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන වෙතින් මාසයට අදාල සියලුම චෙක්පත් නියමිත දිනට එවා ඇද්ද යන්න හා එම චෙක්පත් අප්‍රමාදව බැංකුගත කලේද යන්න හඳුනාගැනීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙලක් අනුගමනය නොකරන බව විගණනයේදී අනාවරණය විය. |

## 2. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනය අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ බෙදා හැරීමට ඇති ශුද්ධ ආදායම රු.2,022,174,457 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා බෙදාහැරීමට ඇති ශුද්ධ ආදායම රු.1,366,400,312 ක් විය.ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.655,774,145 ක වර්ධනය සඳහා ආයෝජන ආදායම රු.190,390,600 කින් වැඩිවීම සහ පොළී අනුපාත සමාන කිරීමේ සංචිත ගිණුම (Interest rate Equalization Reserve) හා අක්‍රිය සාමාජික වෙන්කිරීමේ ගිණුමෙන් පිළිවෙලින් රු.281,650,220 ක් හා රු.5,000,000 ක් නැවත ආදායමට ගැනීම විශේෂයෙන් බලපා තිබුණි.

## 3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

### 3.1 <u>කාර්ය සාධනය</u>

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මගින් විශ්වවිද්‍යාල සඳහා පිහිටුවා තිබූ අර්ථසාධක අරමුදලේ වියදම් ලෙස පොළී, විගණන ගාස්තු, බැංකු ගාස්තු හා ලිපි ද්‍රව්‍ය පමණක් ගිණුම් ගත කර තිබුණු අතර අනෙකුත් පරිපාලන හා වෙනත් වියදම් අර්ථසාධක අරමුදල යටතේ ගිණුම් ගත කර නොතිබුණි.

## 4. <u>ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය</u>

### 4.1 <u>ක්‍රියාකාර් සැලැස්ම</u>

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පිහිටුවා ඇති අරමුදලකි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ක්‍රියාකාර් සැලැස්මෙහි, විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සැලසුම්ගත කාර්යයන් පෙන්නුම් කරයි. 2011 / 2012 ක්‍රියාකාර් සැලැස්ම අනුව වෛද්‍ය රක්ෂණ ක්‍රමයක් ඇතිකර ක්‍රියාත්මක කිර්මට සැලසුම්කර තිබුණද එම කාර්‍යය 2012 දෙසැම්බර් 31 දින දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි.

## 5. <u>පද්ධති හා පාලනයන්</u>

විගණනයේදී නිර්ක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වර්න් වර අරමුදලේ සභාපතිවරයාගේ අවධානයට යොමුක කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂ අවධානය යොමුකල යුතුය.

(i) සාමාජික අරමුදල් ලැබීම් හා නිදහස් කිර්ම.

(ii) මුදල් හා බැංකු